# අ.පො.ස උසස් පෙළ



## ගිණුම්කරණය




# ඒකකය 03

# ගණුදෙනුවක ද්විත්ව සටහන

## ගණුදෙනුවක ද්විත්ව ස්වරූපය

### 3.1.1. ගණුදෙනුවක ද්විත්ව ස්වරූපය

- ගණුදෙනුවක ද්විත්ව ස්වරූපය පැහැදිලි කරන්න
  - ✓ පිළිතුරු

ගණුදෙනුවක දිවිත්ව ස්වරූපය යනු

සෑම ව්‍යාපාරික ගණුදෙනුවකම ද්විත්ව ස්වරූපයක් පවතී. එය වැඩිවීම හා අඩුවීම ලෙස අනාවරණය කර ගත හැක.

උදා : සුපුන් ව්‍යාපාරයක් ආරම්භ කරමින් රු. 800000ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම. මෙම ගණුදෙනුවේ සිවිත්ව ස්වරූපය පහත දැක්වේ.

- පළමු බලපෑම :

ව්‍යාපාරයේ මුදල් නමැති වත්කම රු. 800000 කින් වැඩිවීම.

- දෙවන බලපෑම :

ව්‍යාපාරයේ ප්‍රාග්ධනය රු.800000කින් වැඩිවීම.

### 3.1.2. ද්විත්ව සටහන් ක්‍රමය

- ද්විත්ව සටහන් ක්‍රමය යනු කුමක්ද?
  - ✓ පිළිතුරු

ද්විත්ව සටහන් ක්‍රමය යනු ගණුදෙනුවක ද්විත්ව බලපෑම එයට සම්බන්ධිත ගිණුම් වල හර සහ බැර වශයෙන් එකවර සටහන් කිරීමයි.

- ව්‍යාපාර ගණුදෙනු මගින් බිහිවන ගිණුම් වර්ග දක්වන්න
  - ✓ පිළිතුරු

ගිණුම් වර්ග 05 කි.

- වත්කම් ගිණුම
- වියදම් ගිණුම
- ආදායම් ගිණුම
- වගකීම් ගිණුම
- හිමිකම් ගිණුම


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

◆ ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ව්‍යාපාරික ගණුදෙනු ගිණුම් වල වාර්තා කිරීමට අදාළ රීතීන් දක්වන්න

✓ පිළිතුරු

රීතින් වන්නේ

වත්කම් / වියදම් ගිණුම්

- ➢ වත්කම් ගිණුම්
- ➢ වියදම් ගිණුම්

වැඩිවීම හර
අඩුවීම බැර

| හර | බැර |
|---|---|
| වැඩිවීම | අඩුවීම |

ආදායම් / වගකීම් / හිමිකම් ගිණුම්

- ➢ ආදායම් ගිණුම්
- ➢ වගකීම් ගිණුම්
- ➢ හිමිකම් ගිණුම්

වැඩිවීම බැර
අඩුවීම හර

| හර | බැර |
|---|---|
| අඩුවීම | වැඩිවීම |

## 3.1.3. ගිණුම හා එහි ආකෘතිය

◆ ගිණුම යන්න පැහැදිලි කරන්න

අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක මයා,කු/මලියදේව (පිරිමි විද්‍යාලය),කුරුණෑගල.
යූ.බී.ධර්මදාස මයා,අ/තඹුත්තේගම විද්‍යාලය, තඹුත්තේගම
යූ.අතුල ඒකනායක මයා,මා/ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ
සැකසුම - එච්.එම්.කේ.ජී.නිශාදි චන්ද්‍රමාලි රත්නායක මෙය,පො/මින්නේරිය ජාතික පාසල,හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

✓ පිළිතුරු

ගණුදෙනුවක ද්විත්ව බලපෑම වාර්තා කිරීම සඳහා ලෙජරය තුළ පවත්වාගන යන ආකෘතිය ගිණුම වේ.

◆ ගිණුමක ආකෘතිය දක්වන්න

✓ පිළිතුරු

තිරස් ආකෘතිය

තිරස් ආකෘතිය

..............................ගිණුම

හර | බැර

| දිනය | විස්තරය | සහල | වට්නාකම | දිනය | විස්තර | සහල පිටුව | වට්නාකම |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | | | | |

සිරස් ආකෘතිය

| දිනය | විස්තරය | සහල පිටුව | හර (රු) | බැර(රු) | ශේෂය (රු) |
|---|---|---|---|---|---|
| | | | | | |

◆ ගිණුමක ආකෘතිය තුළ දැක්වෙන තොරතුරු මොනවාද?

✓ පිළිතුරු

ගණුදෙනුව සිදුවූ දිනය

ගණුදෙනුවට අදාළ විරුද්ධ ගිණුමේ නම

ගණුදෙනුවට අදාළ විරුද්ධ ගිණුමේ පිටු අංකය

ගණුදෙනුවට අදාළ වටිනාකම



e තක්සලාව The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

### 3.1.4. පොදු ලෙජරය හා උප ලෙජරයන්

◆ පොදු ලෙජරය යන්න හඳුන්වන්න

✓ පිළිතුරු

පොදු ලෙජරය යනු ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගණුදෙනු වල මූල්‍ය ප්‍රතිඵලය වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යන ගිණුම් අඩංගු ස්ථානය

මෙය පොත , පොත් කට්ටලයක් හෝ උපාංගයක් විය හැකිය.

◆ උප ලෙජරය යන්න හඳුන්වන්න

✓ පිළිතුරු

- උප ලෙජරයක් යනු එකම ස්වරූපයේ ගණුදෙනු සිදුවන ගිණුම් රාශියක් ඇති විටක එම ගිණුම් සියල්ල වෙනුවෙන් පොදු ලෙජරයට අමතරව , සිහිවටන ක්‍රමයට (තනි සටහන් ක්‍රමයට) පවත්වා ගන යන ලෙජරයයි.

උදා : ණයගැති උප ලෙජරය

- ව්‍යාපාරයක වෙළඳ ණය ගැතියන් රාශියක් ඇති විටක එම ණයගැතියන්ගේ පෞද්ගලික ගිණුම් වෙනුවෙන් පවත්නාගෙන යනු ලබන ණයගැති උප ලෙජරය

ණයහිමි උපලෙජරය

- ව්‍යාපාරයක වෙළඳ ණය හිමියන් රාශියක් ඇති විටක එම ණයහිමියන්ගේ පෞද්ගලික ගිණුම් වෙනුවෙන් පවත්නාගෙන යනු ලබන ණයහිමි උප ලෙජරය

පොදු ලෙජරය (ද්විත්ව සටහන් ක්‍රමයට අනුව)

ණයහිමි පාලන ගිණුම

| | |
|---|---|
| | ශේෂය 1500 |

ණයගැති පාලන ගිණුම

| | |
|---|---|
| ශේෂය 1500 | |


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

උප ලෙජර

වෙළඳ ණයහිමි
(එක් එක් පෞද්ගලික ගිණුම්)

වෙළඳ ණයගැති
(එක් එක් පෞද්ගලික ගිණුම්)

**සඳුනි**

| | |
|---|---|
| | ශේෂය 200 |

**තෙපුල්**

| | |
|---|---|
| ශේෂය 100 | |

**සකුණි**

| | |
|---|---|
| | ශේෂය 300 |

**සපුමල්**

| | |
|---|---|
| ශේෂය 200 | |

**සකුමලි**

| | |
|---|---|
| | ශේෂය 400 |

**රවිමල්**

| | |
|---|---|
| ශේෂය 300 | |

**සුපුනි**

| | |
|---|---|
| | ශේෂය 600 |

**සුවිමල්**

| | |
|---|---|
| ශේෂය 400 | |

අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක මයා,කු/මලියදේව (පිරිමි විද්‍යාලය),කුරුණෑගල.
යූ.බී.ධර්මදාස මයා,අ/තඹුත්තේගම විද්‍යාලය, තඹුත්තේගම
යූ.අතුල ඒකනායක මයා,මා/ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ
සැකසුම - එච්.එම්.කේ.ජී.නිශාදි චන්ද්‍රමාලි රත්නායක මෙය,පො/මින්නේරිය ජාතික පාසල,හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

### 3.1.5. ගණුදෙනු ද්විත්ව සටහන් ක්‍රමය මත ගිණුම්වල සටහන් කිරීම

- පහත දැක්වෙන්නේ ලෝචනගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයට අදාළව සිදුවූ ගණුදෙනු වේ.
- 2017.04.01 ප්‍රාග්ධනය ලෙස මුදලින් රු.500000ක් හා රු.800000ක වටිනා ඉඩම් හා ගොඩනැගිලි ව්‍යාපාරයට යෙදවීය.
- 2017.04.03 අත්පිට ගැනුම් රු.50000
- 2017.04.05 ලී බඩු උපකරණ මිලදී ගත්තා රු.40000
- 2017.04.07 අත්පිට මුදලට විකුණුම් රු.70000
- 2017.04.10 විදුලි බිල ගෙව්වා රු.1000
- 2017.04.12 බැංකු ණයක් ගත්තා රු.200000
- 2017.04.15 සේවක වැටුප් ගෙව්වා රු.5000
- 2017.04.17 ලෝචන පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගත්තා රු.2000
- 2017.04.20 බැංකු ණයෙන් රු.12000ක වාරිකයක් ගෙව්වා . පොළිය රු.2000
- 2017.04.25 අරුණට විකුණුම් රු.80000
- 2017.04.28 අතුලගෙන් ගැණුම් රු.30000
- 2017.04.29 අරුණගෙන් ලද මුදල රු.20000

◆ ඉහත ගණුදෙනු පොදු ලෙජරය තුළ සටහන් කරන්න

✓ පිළිතුරු

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| 4/1 ප්‍රාග්ධන | 500 | 4/3 ගැනුම් | 50 |
| 4/7 විකුණුම් | 70 | 4/5 ලීබඩු | 40 |
| 4/12බැංකු ණය | 200 | 4/10 විදුලිය | 1 |
| 4/29ණයගැති පාලන | 20 | 4/15 වැටුප් | 5 |
| | | 4/17 ගැනිලි | 2 |
| | | 4/20 ණය වාරික | 12 |


Copyright © e-thaksalawa.moe.gov.lk

### ප්‍රාග්ධන ගිණුම

| | |
|---|---|
| | 4/1 මුදල් 500 |
| | 4/1 ඉඩම් ගොඩනැ.800 |

### ඉඩම් හා ගොඩනැගිලි

| | |
|---|---|
| 4/5 ප්‍රාග්ධන 40 | |

### ලී බඩු උපකරණ ගිණුම

| | |
|---|---|
| 4/5 මුදල් 40 | |

අන්තර්ගතය - ඩී.එම්.එස්.දිසානායක මයා,කු/මලියදේව (පිරිමි විද්‍යාලය),කුරුණෑගල.
යූ.බී.ධර්මදාස මයා,අ/තඹුත්තේගම විද්‍යාලය, තඹුත්තේගම
යූ.අතුල ඒකනායක මයා,මා/ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ

සැකසුම - එච්.එම්.කේ.ජී.නිශාදි චන්ද්‍රමාලි රත්නායක මෙය,පො/මින්නේරිය ජාතික පාසල,හිඟුරක්ගොඩ

The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

### ගැනුම් ගිණුම

| | |
|---|---|
| 4/3 මුදල් 50 | |
| 4/3 ණයහිමි පාලන 30 | |

### විදුලි වියදම් ගිණුම

| | |
|---|---|
| 4/10 මුදල් 1 | |

### බැංකු ණය පොළී ගිණුම

| | |
|---|---|
| 4/12 මුදල් 2 | |



Copyright © e-thaksalawa.moe.gov.lk

බැංකු ණය ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/12 | මුදල් | 12 | 4/12 | මුදල් | 200 |

ණයගැති පාලන

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/25 | විකුණුම් | 80 | | | |

ණයහිමි පාලන

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 4/3 | ගැනුම් | 30 |



Copyright © e-thaksalawa.moe.gov.lk

## වැටුප් ගිණුම

| | |
|---|---|
| 4/15 මුදල් 5 | |

## ගැනිලි

| | |
|---|---|
| 4/17 ගැනිලි 2 | |

## විකුණුම් ගිණුම

| | |
|---|---|
| | 4/7 විකුණුම් 70 |
| | 4/7 ණයගැති පාලන 80 |



Copyright © e-thaksalawa.moe.gov.lk

## 3. මූල්‍ය ප්‍රකාශන මූලිකාංග

◆ මූල්‍ය ප්‍රකාශන මූලිකාංග යනු කවරේද?

✓ පිළිතුරු

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදාගන්නා මූලික අංග මූල්‍ය ප්‍රකාශන මූලිකාංග වේ.






Copyright © e-thaksalawa.moe.gov.lk